**ශීර්ෂය - 166 -ජල සම්පාදන අමාත්‍යාංශය**
**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය
------------------------------

ජල සම්පාදන අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජල සම්පාදන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 25 වන දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූනි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ජල සම්පාදන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකිම
--------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මුල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මුල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මුල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛයේ 10.1 ඡේදය යටතේ වූ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට අදාල මාර්ගෝපදේශ අංක 06 හි 07 (vi) ඡේදය ප්‍රකාරව, මුල්‍ය කාර්ය සාධන වාර්තාව අනුව වර්ෂය අවසානයේ භාණ්ඩාගාරයට පියවිය යුතු හෝ භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු වටිනාකම හා මුදල් පොතට අනුව භාණ්ඩාගාරයට පියවිය යුතු අගය අනිවාර්යයෙන්ම වෙනස් අගයක් ගන්නා බැවින් එම ශේෂයන් සැසඳීම සඳහා අක්මුදල් ගැලපීම් ගිණුමක් සකස්කර මුල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | අක්මුදල් ගැලපුම් ගිණුම අවසාන ගිණුම සමඟ ඉදිරිපත් නොකළ බව පිළිගන්නා අතර පසුව විගණන නිළධාරීන් කරන ලද ඉල්ලීම අනුව එය විගණනයට ඉදිරිපත් කරන ලදී. | 2020 ඔක්තෝබර් 10 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 06 හි 7(vi) ඡේදය ප්‍රකාරව නිවැරදි ලෙස පිළියෙල කරන ලද අක් මුදල් ගැලපුම් ගිණුමක් සකස් කර මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළ යුතු වීම. |

### 1.6.2 මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2020 වර්ෂය තුල අත්පත් කර ගත් මූලධන වත්කම් වල වටිනාකම මූල්‍ය කාර්ය සාධන වාර්තාව හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව රු.443,308 ක් වුවද විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛනය අනුව (ඒසීඒ-6 ආකෘතිය) එය රු.303,010 ක් වීම හේතුවෙන් රු.140,298 ක වෙනසක් නිරීක්ෂණය විය. | නිරීක්ෂණය පිළිගෙන එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අත්පත් කර ගත් මූලධන වත්කම් වල වටිනාකම අදාල උපලේඛන සමග නිවැරදිව සන්සන්දනය කල යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශ අනුව සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් රු.2,019,711,521 ක් වුවත් අමාත්‍යාංශ මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශයේ එය රු.163,958,578 ක් වැඩියෙන් රු.2,183,670,099 ක් ලෙස දක්වා තිබුණි. | වර්ෂයේ මුල් මාස 08 තුළ නිවාස අමාත්‍යාංශය හා සම්බන්ධව සිටීම නිසා අක්මුදල් එම අමාත්‍යාංශය වෙත ලැබුණු අතර අවසාන කාර්තුවේ පමණක් ජලසම්පාදන අමාත්‍යාංශය වෙත අක් මුදල් ලැබුණි. | 2020 ඔක්තෝබර් 10 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 06 හි 7(vi) ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |
| (ඇ) අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව වූ රු.2,505,627,219 ක වෙනත් ලැබීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් යටතේ දක්වා නොතිබුණි. | රු. 2,505,627,219 ක ආදායම් රැස් කිරීමක් සිදුකර නැති අතර හඳුනා ගත් ආදායම් රැස් කිරීම් ACA 3 මඟින් නිරූපනය කර ඇත. | -එම- |

**1.6.3 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ----------------------- | -------------------------------- | ----------- |
| (අ) භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශ අනුව මූල්‍ය නොවන වත්කම් යටතේ හඳුනාගත යුතු දේපල, පිරියත හා උපකරණ වටිනාකම රු.2,074,113,966 ක් වුවද අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එය රු.1,690,663,840ක් අඩුවෙන් රු.383,450,126 ක් ලෙස දක්වා තිබුණි. ඒ හේතුවෙන් මූල්‍ය තත්ව ප්‍රකාශයේ දක්වා තිබූ දේපල, පිරියත හා උපකරණ සංචිත වටිනාකම ද එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 2020 වර්ෂය තුළ 166 ශීර්ෂය යටතේ ජලසම්පාදන අමාත්‍යාංශය හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යන අංශ දෙකම ගිණුම්කරණ කටයුතු සිදු කරන ලද අතර 2020 අගෝස්තු වලින් පසුව අමාත්‍යාංශ වෙන්වූ බැවින් උසස් අධ්‍යාපන අමතාංශයට අයත් ස්ථාවර වත්කම් එම ආයතනයට පවරා දෙන ලදී. | 2020 ඔක්තෝබර් 09 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රෙල්ඛයේ 10.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් වටිනාකම් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ අනුව සැසඳුම් කර මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතු වීම. |
| (ආ) භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශ අනුව 2020 දෙසැම්බර් 31 දිනට නොපියවූ අග්‍රිම ශේෂය රු.2,378,366 ක් වුවද එය මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ භාණ්ඩාගාරයට පියවිය යුතු අග්‍රිම ශේෂය ලෙස හඳුනාගෙන | විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු නිවැරදිය. | 2020 ඔක්තෝබර් 10 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 06 හි 7(vi) ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| නොතිබුණි. කෙසේ වෙතත් අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව එම ශේෂය 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයට පියවා තිබුණද, එය මාර්ගස්ථ ශේෂයක් ලෙස පවතින හෙයින් මූල්‍ය තත්ව ප්‍රකාශයේ මූල්‍ය වත්කම් යටතේ මුදල් හා මුදල් හා සමාන දෑ ලෙස ද හඳුනාගත යුතුව තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | | |

**1.6.4 මුදල් ප්‍රවහා ප්‍රකාශය**

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව වෙනත් ගණන් දීමේ නිලධාරීන් වෙනුවෙන් වූ ආදායම් සංකේත හතක් සඳහා එකතු කර තිබූ රු.2,505,627,219 ක ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | රු. 2,505,627,219 ක ආදායම් රැස් කිරීමක් සිදුකර නැති අතර හඳුනා ගත් ආදායම් රැස් කිරීම් ACA 3 මගින් නිරූපණය කර ඇත. | 2020 ඔක්තෝබර් 10 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 06 හි 7(vi) ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |
| (ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ අග්‍රිම ලැබීම් ලෙස රු.2,183,670,099 ක් දක්වා තිබුණද විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව අග්‍රිම ලැබීම් රු. 2,176,192,738 ක් වූයෙන් රු. 7,477,361 ක වෙනසක් නිරීක්ෂණය විය. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි වෙනසක් නිරීක්ෂණය නොවේ. | -එම- |
| (ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහයන් යටතේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්, සහනාධාර මාරු කිරීම් , වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් හා | නිවැරදිව ගිණුම් ගතකර ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| | භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම යන අයිතම වෙනුවෙන් දක්වා තිබූ වටිනාකම් හා විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව දැක්විය යුතු වටිනාකම් අතර එකතු වටිනාකම රු.4,532,317,064 ක වෙනසක් පවතින බව නිරීක්ෂණය විය. | | |
| (ඈ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ අත්තිකාරම් අයකර ගැනීම් ලෙස රු.5,843,298 ක් දක්වා තිබුණද විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එය රු.3,592,517 ක් වූයෙන් රු.2,250,781 ක වෙනසක් නිරීක්ෂණය විය. | නිවැරදිව ගිණුම් ගතකර ඇත. | -එම- |
| (ඉ) | ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහ යටතේ භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම සඳහා සහ අත්තිකාරම් ගෙවීම සඳහා පිළිවෙලින් රු.1,849,937,553 ක් හා රු.8,564,602 ක් වැයකර ඇති බව දක්වා තිබුණි. එසේ වුවත් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව භෞතික වත්කම් ඉදි කිරීම හෝ මිලදී ගැනීම සඳහා සහ අත්තිකාරම් ගෙවීම් වෙනුවෙන් රු.443,308 ක් හා රු.4,110,979 ක් පමණක් දරා තිබීම හේතුවෙන් පිළිවෙලින් රු.1,849,494,245 ක සහ 4,453,623 ක වෙනසක් නිරීක්ෂණය විය. | භෞතික වත්කම් ඉදි කිරීම හෝ මිලදී ගැනීම් වටිනාකම දැක්වීමේදී මූලධන වත්කම් පුනුරුත්ථාපන හා වැඩිදියුණු කිරීම වෙනුවෙන් දරා ඇති වියදම්ද සැලකිල්ලට ගෙන ඇත. අත්තිකාරම් ගෙවීම් වශයෙන් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇත්තේ වර්ෂය තුළ රජයේ නිලධාරීන් වෙත ගෙවන ලද ණය හා අත්තිකාරම් වෙනුවෙන් දරණ ලද වටිනාකමයි. | -එම- |
| (ඊ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ යටතේ තැන්පතු ලැබීම් ලෙස රු. 52,900,868 ක් සහ මුදල් වැය කිරීම් යටතේ තැන්පත් ගෙවීම් ලෙස රු.244,631,232 ක් හඳුනාගෙන තිබුණද විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව තැන්පත් ලැබීම් | තැන්පත් ලැබීම් හා ගෙවීම් තොරතුරු ජීසීජ් 4 මගින් දක්වා ඇති අතරම තැන්පත් ලෙජරය හා සිගාස් ගිණුම මඟින් ද ශේෂ පරීක්ෂා කර මෙය තහවුරු කර ගත හැක. | -එම- |

රු.8,096,590 ක් හා තැන්පත් ගෙවීම් රු.17,356,836 ක් වූයෙන් පිලිවෙලින් රු.44,804,278 ක හා 227,274,396 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණ වලදි නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මු.රෙ. 891 (1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුලත් ඇප ලේඛනයක් පිළයෙල කර නොතිබුණි. | ඇප තැබිය යුතු නිලධාරීන් දැනුවත් කර ඇප තැන්පත් කිරීමට අදාළ කටයුතු කරගෙන යනු ලැබේ. | මුදල් රෙගුලාසි 891 (1) හි සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. |
| (ආ) | මු.රෙ. 753(2) ප්‍රකාරව ගබඩාවට භාණ්ඩ භාර ගන්නා විට භාණ්ඩ ලැබීම් පත්‍රිකාවක සටහන් කර නොතිබුණි. | ගබඩාවට භාණ්ඩ භාර ගන්නා විට අදාළ ලේඛනයට අයත් අංකය හා පිටු අංකය සටහන් කොට ගබඩා භාර නිළධාරියාගේ අත්සන හා දිනය යොදනු ලබන අතර අදාළ ලේඛණයේ භාණ්ඩ ඇතුළත් කළ පිටුවෙහි මාණ්ඩලික නිළධාරියාගේ අත්සන ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංකේත අංක 166-1-1-1403 යන වැය විෂයය සඳහා වන රු. 121,000 ක ශුද්ධ ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි. | අමාත්‍යතුමා වෙත නිල නිවාස ලබා දී ඇත්තේ 2020 වර්ෂයේ දෙසැම්බර් මස වන බැවින් ඒ සඳහා වන බිල්පත් 2020 වර්ෂය තුළ ගෙවීම් සඳහා ඉදිරිපත් වී නොමැත. | මු.රෙ. 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයය තුනක් සඳහා වූ රු. 934,000 ක ප්‍රතිපාදන මු.රෙ. 66 යටතේ සම්පූර්ණයෙන් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. | කොරෝනා වසංගත තත්වය හේතුවෙන් සැලසුම් කළ වැඩසටහන් ක්‍රියාත්මක කළ නොහැකි විය. | -එම- |
| (ඇ) | පුනරාවර්තන වැය විෂයයන් පහක් සඳහා වූ රු.1,342,000 වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට සියයට 50 දක්වා ප්‍රමාණයක් ඉතිරි කර තිබුණි. | කොරෝනා වසංගත තත්වය හේතුවෙන් අමාත්‍යාංශය දිගු කලක් වසා තැබී නිසා ප්‍රතිපාදන ඉතිරිවිය. | -එම- |
| (ඇ) | පුනරාවර්තන විෂයයන් පහක් සඳහා වූ රු. 4,163,000 ක් වූ ඇස්තමේන්තු ප්‍රතිපාදන වලින් සියයට 19 සිට 53 ක අතර ප්‍රමාණයක් මු.රෙ 66 මඟින් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. | 2020 සැප්තැම්බර් 01 දින සිට රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවීමේ දී ජල සම්පාදන අමාත්‍යාංශයට ඉල්ලුම් කරන ලද අයවැය ඇස්තමේන්තු අගයන් රාජ්‍ය අමාත්‍යාංශය වෙත නව අයවැය ලෙස ලබා දුන් බැවින් ජල සම්පාදන අමාත්‍යාංශයේ ඇතැම් වැය විෂයන් වලට ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීය. | -එම- |
| (ඉ) | මූල ධන වැය විෂයයන් හයක් සඳහා වූ රු. මිලියන 463.37 ක ශුද්ධ ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරි කර තිබුණි. | 2020 වසරේ පැවති කොරෝනා වසංගතය, අක්මුදල් ලැබීමේ ප්‍රමාදය 166-2-5-40-2201 (17) වැය විෂයයට අදාලව සැලසුම් කර තිබූ බේරුම් කිරීමේ | -එම- |

| | | | |
|---|---|---|---|
| | | කටයුත්ත නිරවුල් නොවීම ප්‍රතිපාදන ඉතිරියට හේතු ලෙස දක්වා තිබුණි. | |
| (ඊ) | මූල ධන වැය විෂයය 22 ක් සඳහා වූ රු.මිලියන 20,072.6 ක ශුද්ධ ප්‍රතිපාදන වලින් සියයට 21 සිට සියයට 98 දක්වා වූ ඉතිරි කර තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්වයය, ඇතැම් ව්‍යාපෘති සඳහා වැට් බදු නිදහස් කිරීම, භාණ්ඩාගාරයෙන් අක්මුදල් ලැබීමේ ප්‍රමාදය, ව්‍යාපාති බිල්පත් සම්බන්ධ ගැටළු යනාදී හේතූන් මත අනිකුත් ප්‍රතිපාදන ඉතිරිවී ඇත. | -එම- |
| (උ) | සමාලෝචිත වර්ෂයේ සංවර්ධන වැඩසටහන් ව්‍යාපෘති 35ක ශුද්ධ ප්‍රතිපාදන රු. මිලියන 75,179.62 ක් විය. එසේ වුවද එම ව්‍යාපෘති වල වියදම රු. මිලියන 64,891.39 ක් පමණක් වුයෙන් රු. මිලියන 10,288.23 ක් ඉතිරි වී තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිය සියයට 14ක් වී තිබුණි. | කොවිඩ් වසංගත තත්වය හා භාණ්ඩාගාරයෙන් අක් මුදල් ලැබීමේ ප්‍රමාදයන් නිසා ප්‍රතිපාදන ඉතිරි විය. | -එම- |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 751 (4) | ගබඩාවට ලැබෙන භාණ්ඩ සම්බන්ධයෙන් භාණ්ඩ ලැබීම් පත්‍රිකා වල සටහන් කිරීමෙන් පසුව තොග ලේඛන වලට ඇතුලත් කිරිමට කටයුතු කර නොතිබුණි. | ගබඩාවට භාණ්ඩ භාර ගන්නා විට අදාළ ලේඛනයට අයත් අංකය හා පිටු අංකය සටහන් කොට ගබඩා භාර නිළධාරියාගේ අත්සන හා දිනය යොදනු ලබන අතර අදාළ ලේඛණයේ භාණ්ඩ ඇතුළත් කළ පිටුවෙහි මාණ්ඩලික නිළධාරියාගේ අත්සන ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ගබඩාවට ලැබෙන භාණ්ඩ, භාණ්ඩ ලැබීම් පත්‍රිකාවක සටහන් කළ යුතු වීම. |

(ආ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| (i) 2009 ජුනි 17 දිනැති අංක 09/2009 (1) දරන චක්‍රලේඛය | අමාත්‍ය කාර්ය මණ්ඩලය තම සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මගින් සනාථ කල යුතු වුවද එසේ සිදු කර නොතිබුණි. | ප්‍රායෝගිකව ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කිරීම අපහසු බව ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම් විසින් කරුණු ඉදිරිපත් කර ඇත. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ii) 2019 ජුනි 27 දිනැති අංක 03/2019 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛය | වර්තමාන සේවා ස්ථානයේ වසර 05කට වැඩි කාලයක් සේවයේ නියුතු නිලධාරීන් ස්ථාන මාරු වීම් වලට යටත් වුවද 2007 වර්ෂයේ සිට සේවයේ නියුතු සංවර්ධන නිලධාරී හා කළමනාකරණ සේවා නිලධාරී යන තනතුරු වලට අයත් නිලධාරීන් 25ක් ස්ථාන මාරු වීම් නොලබා අඛණ්ඩව සේවයේ නිරත වී සිටි බව නිරීක්ෂණය විය. | ස්ථාන මාරු ක්‍රියාවලිය වර්තමානයේ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. | ඒකාබද්ධ සේවා චක්‍රලේඛ ප්‍රකාරව ස්ථාන මාරුවීම් නිසි කාලය තුල ලබා දිය යුතු වීම. |
| (iii) 2020 සැප්තැම්බර් 21 දිනැති අංක 13/2020, 14/2020, 15/2020 හා 17/2020 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛ | වසර 05කට අධික කාලයක් ස්ථාන මාරුවීම් නොලබා සේවය කරන මාණ්ඩලික නිලධාරීන් පස්දෙනෙකු සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අමාත්‍යාංශයේ සේවයේ යෙදෙන බව නිරීක්ෂණය විය. | ස්ථාන මාරු ක්‍රියාවලිය වර්තමානයේ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. | ඒකාබද්ධ සේවා චක්රලේඛ ප්‍රකාරව ස්ථාන මාරුවීම් නිසි කාලය තුල ලබා දිය යුතු වීම. |
| (iv) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | අමාත්‍යාංශයේ වාහන සඳහා ඉන්ධන දහනය පිළිබඳ පරික්ෂාවන් සිදුකර නොතිබුණි. | අමාත්‍යාංශයේ සංචිතයට අයත් වාහන වල ඉන්ධන දහනය පරීක්ෂා කිරීමේ කටයුතු සිදුකිරීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදුකරමින් පවතී. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව වාහනවල ඉන්ධන පරීක්ෂාවන් සිදු කල යුතු වීම. |

(ඇ) **රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| (i) 2015 ජූලි 01 දිනැති අංක 02/2015 දරන චක්‍රලේඛයේ 09 (අ) ඡේදය | වාහන අයිතිය ආයතනය වෙත පවරා ගැනීමකින් තොරව වාහන 04ක් අපහරණය කිරීමට කටයුතු කර තිබුණි. | විටින් විට අවසන්වූ ව්‍යාපෘති වලින් භාරදී ඇති වාහන සහ අමාත්‍යාංශයේ නම වෙනස් වීම මත එම අවස්ථාවේ අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කරන ලද වාහන අපහරණය කිරීමට කටයුතු කර ඇත. | වාහන අපහරණය සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ii) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන චක්‍රලේඛයේ | | | |
| • 3.1.4.ඡේදය | 2019 වර්ෂයේදී භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගත් ඌනතා, අතිරික්තතා සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | 2019 භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගත් ඌණතා/අතිරික්තතා 2020 භාණ්ඩ සමීක්ෂණයට පෙර තුලනය කර ඇත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| • 3.1.5. ඡේදය | පොදු 47 වාර්තාවෙන් දක්වා ඇති භාණ්ඩ සම්බන්ධයෙන් සෑම මුදල් වර්ෂයකම පෙබරවාරි 26 දිනට පෙර අවශ්‍ය කටයුතු කළ යුතු වුවත් 2019 භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගත් වෙන්දේසි කළයුතු හා අපහරණය කළ යුතු භාණ්ඩ සඳහා එකී උපදෙස් අනුගමනය කර නොතිබුණි. | කොරෝනා වසංගත තත්වය හේතුවෙන් 2019 භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගත්, වෙන්දේසි කළ යුතු හා අපහරණය කළ යුතු භාණ්ඩ සඳහා අදාළ වෙන්දේසිය ප්‍රමාදවී 2020 සැප්තැම්බර් 18 දින පැවැත්වීමට සිදු විය. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.3 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

---------------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට නොවැම්බර් දක්වා අවස්ථා 13 කදී විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබූ රු.141,010 ක් වූ අත්තිකාරම් මුදල් පියවීමේ දී දින 07 සිට මාස 03 දින 04 දක්වා වූ කාල පරාසයක ප්‍රමාදයක් දක්නට විය. | ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව අත්තිකාරම් පියවීමටත් ලේඛණ ගත කිරීමටත් කටයුතු කරනු ලැබේ. | කාර්යය නිම කළ විගස අත්තිකාරම් පියවීම කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2020 වර්ෂය සඳහා කාර්තු පදනමින් ක්‍රියාකාරී සැලසුම් සකස් කර තිබුණ ද , එම චක්‍රලේඛයේ ඡේද අංක 3 ප්‍රකාරව සැලසුම් කර ඇති ප්‍රධාන සංවර්ධන වැඩ සටහන් වෙනුවෙන් වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් ඉදිරිපත් කර නොතිබුණි. තවද, ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ ඇතැම් ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට අපේක්ෂිත සමස්ථ ප්‍රගතිය දක්වා නොතිබුණි. | විගණනය පෙන්වා දී ඇති පරිදි 2020 වසර සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අංග සම්පූර්ණ කර නොමැති බව පිළිගනිමි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රතිපාදනයන්ට අනුව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වීම. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මහ පරිමාණ ජලසම්පාදන හා මලාපවහන ව්‍යාපෘතින් 11ක් සම්බන්ධයෙන්, 2020 අවසන් කාර්තුමය ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත භෞතික ප්‍රගතිය ලබා කර ගැනීමට අපොහොසත්ව තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | කොවිඩ් 19 වසංගත තත්වය, ජල මූලාශ්‍රය වෙනස් කිරීමට සිදු වීම, ඉඩම් සම්බන්ධයෙන් වූ මහජන විරෝධතා, ටෙන්ඩර් කැඳවීමේ ප්‍රමාදයන්, භූමිය කැණීමේ දුෂ්කරතා හා ඩ්‍රෝන සමීක්ෂණ කටයුතු තහනම් කිරීම යනාදිය හේතුවෙන් අපේක්ෂිත භෞතික ප්‍රගතිය ළඟාකරගත නොහැකි විය. | වර්ෂය ආරම්භයේදී සැලසුම් කළ පරිදි අදාල ව්‍යාපෘති ප්‍රගතිය කරා ළඟා වීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අමාත්‍යාංශය විසින් සෘජුව ක්‍රියාත්මක කරන ලද හා සමාලෝචිත වර්ෂය තුළ නිම කළ යුතුව තිබූ ව්‍යාපෘති 07 ක් වර්ෂය අවසානය වන විටත් අපේක්ෂිත පරිදි නිම කර ගැනීමට නොහැකිව පැවතුණි. | භාණ්ඩාගාරයෙන් අක්මුදල් නිසිපරිදි නොලැබීම, ඉඩම් ගැටළු, කොවිඩ් 19 වසංගත තත්වය මෙකී ව්‍යාපෘති ප්‍රමාදයට හේතු විය. | වර්ෂය ආරම්භයේදී සැලසුම් කළ පරිදි අදාල ව්‍යාපෘති ප්‍රගතිය කරා ළඟා වීමට කටයුතු කළ යුතු වීම. |

**3.3 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | --------------------------------- | ------------ |
| (අ) | වකුගඩු රෝග නිවාරණ වැඩ සටහන යටතේ මොණරාගල දිස්ත්‍රික්කයේ ජල සම්බන්ධතා ලබාදීමේ ව්‍යාපෘතිය තුලින් නව ජල සම්බන්ධතා 650ක් ලබා දීමට ඉලක්ක කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානයට නව ජල සම්බන්ධතා 165ක් පමණක් ලබා දී තිබුණි. 2019 වර්ෂයේ එකී ව්‍යාපෘතිය වෙනුවෙන් ලද රු. 1,033,826 ක මුදල අදාල කාර්යය සඳහා යොදා නොගෙන 2020 වර්ෂයේදී රජයේ ආදායමට බැරකර තිබුණි. | නිර්දේශිත අඩු ආදායම් ලාභී නාම ලේඛණයට අනුව පාරිභෝගිකයින් 880 ක් සඳහා නව ජල සැපයුම් ලබා දුන් අතර ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන මොණරාගල දිස්ත්‍රික් ලේකම් මඟින් ජල සම්පාදන මණ්ඩලයට ලැබුණි. එම නිසා අමාත්‍යාංශයේ ඉතිරිව තිබූ රුපියල් 1,033,826 ක මුදල වසර අවසානයේ රජයේ අදායමට බැර කරන ලදී. | ව්‍යාපෘතීන්ගෙන් අපේක්ෂිත ප්‍රගතිය ලබා ගැනීමට කටයුතු කල යුතු වීම. |
| (ආ) | කලාපීය හවුල්කරුවන්ගේ සහභාගීත්වයෙන් වේගවත් ක්‍රියාකාරි ඉගෙනුම් වැඩ මුළුවක් සඳහා 2019 වර්ෂයේදි පොදු තැන්පත් ගිනුමේ තැන්පත් කර තිබූ රු.337,050 ක් හා රු.159,109 ක් වූ මුදල් අදාල කාර්යය සඳහා යොදා නොගෙන 2020 වර්ෂයේදි රජයේ ආදායමට බැර කර තිබුණි. | මෙම වැඩමුලුවේ සියලුම සංවිධාන කටයුතු අමාත්‍යාංශයේ සංවර්ධන අංශයේ නිලධාරීන් මඟින් සිදුකල අතර ඒ හේතුවෙන් මේ සඳහා වැයවෙතැයි අපේක්ෂා කරනු ලැබූ මුදල ඉතිරිවිය. | මු.රෙ. 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |
| (ඇ) | යථෝක්ත කාරණය වෙනුවෙන් 2019 වර්ෂයේදි පොදු තැන්පත් ගිනුමේ රදවා තිබූ රු.1,065,500ක මුදලින් අදාල අරමුණින් බැහැරව ජල ටැංකි මිලදී ගැනීම සඳහා රු. 1,048,593 ක් වැය කර තිබුණි. | මෙම ප්‍රතිපාදන මගින් කොවිඩ් 19 පැතිරීම අවම කිරිම සඳහා පාසල් වෙත ජල ටැංකි ලබා දීමට කටයුතු කරන ලදී. | ව්‍යාපෘතීන් වෙනුවෙන් ලැබී ඇති ප්‍රතිපාදන පරිබාහිර කටයුතු වෙනුවෙන් උපයෝජනය නොකල යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඈ) 2018 වර්ෂයේදි ජාතික විද්‍යා පදනම වෙතින් පුහුණු පාඨමාලාවක් පැවැත්වීම සඳහා ලද රු.100,000ක මුදල එකී කාර්යය සඳහා යොදා නොගෙන නිසා 2020 වර්ෂයේ රජයේ ආදායමට බැර කර තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | මු.රෙ. 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |

## 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යය සාධනය, ඉඩම් නිරවුල් කර ගැනීමේ ප්‍රමාදයන්, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාදයන්, පාරිසරික හා නැවත පදිංචි කිරීමේ ප්‍රමාදයන් යනාදි කරුණු හේතුවෙන් අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණයට යටත් වන විදේශ මූල්‍යන ව්‍යාපෘති 12 ක් සඳහා නිම කිරීම් කාලය ඉක්මවා කොන්ත්‍රාත් දිගුවන් ලබාදී ඇති බව නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් එම ව්‍යාපෘති නිම කිරීමේ කාලය දින 82 සිට දින 1460 කාල පරාසයක සැලකිය යුතු ප්‍රමාදයක් පවතින බව ද නිරීක්ෂණය විය. | නෛතික ගැටළු, නළ එලීමට අදාළ කැනීම් කටයුතු වලදී අනුමැතිය ලබා ගැනීමේදී මුහුණ දීමට සිදුවූ ප්‍රමාදයන්, ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදයන්, කොන්ත්‍රාත් පිරිනැමීමේ ප්‍රමාදය, කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්යසාධන ගැටලු, අනපේක්ෂිත පරිදි දෘඪ පාෂාණ හමුවීම, අයහපත් කාලගුණික තත්වයන්, පාස්කු ප්‍රහාරය හා කොවිඩ් 19 වැනි හේතුන් මත ප්‍රමාදවීම් සිදු විය. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති නිම කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| (ආ) කුඩා පරිමාණ ව්‍යාපෘතියක් වූ අන්දරගස්යාය ව්‍යාපෘතිය 2017 වර්ෂයේ ආරම්භ කොට 2020 අප්‍රේල් මාසයේදී නිම කිරීමට සැලසුම් කර තිබුණ ද 2020 දෙසැම්බර් 31 දිනට දින 245 ක ප්‍රමාදයකින් පසුවත් එම ව්‍යාපෘතිය නිම කිරීමට අපොහොසත්වී තිබුණි. | භාණ්ඩාගාරයෙන් අක්මුදල් නොලැබීම හා කොවිඩ් 19 ව්‍යාප්තියේ බලපෑම මත ව්‍යාපෘතිය ප්‍රමාද විය. | -එම- |

**3.5 නිම නොකළ ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද 2020 දෙසැම්බර් 31 දිනට අවසන් කල යුතුව පැවති තිස්සමහාරාම ජල සම්පාදන ව්‍යාපෘතිය හා ත්‍රිකුණාමල ජල සම්පාදන ව්‍යාපෘතිය අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකිව පැවතුණි. | භාණ්ඩාගාරයෙන් අක්මුදල් නොලැබීම හා කොවිඩ් 19 ව්‍යාප්තියේ බලපෑම මත ව්‍යාපෘතිය ප්‍රමාද විය. | ව්‍යාපෘති සැලසුම් කළ පරිදි නිම කළ යුතුය. |

**3.6 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) <u>අනුමැතියකින් තොරව වාහන භාවිතා කිරීම</u><br>රාජ්‍ය වියදම් කළමනාකරණයට අදාල 2010 මැයි 14 දිනැති අංක සීඒ /1/17/1 දරන ජනාධිපති කාර්යාල ලිපියේ 3.3 ඡේදය ප්‍රකාරව ජල සම්පාදන අමාත්‍යවරයා විසින් පරිහරණය කරනු ලබන ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් අංක CBG-7786 දරන වාහනය සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමෙන්තුව විසින් මෙම රථය අමාත්‍යාංශයේ භාවිතය සඳහා අනුමැතිය ලබා දී ඇත. | ලබා දී ඇති ජනාධිපති කාර්යාල උපදෙස් ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |
| (ආ) <u>වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන පරිහරණය කිරීම</u><br>වෙනත් රාජ්‍ය ආයතන 7 ක් සතු වාහන 13 ක් අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුළ පරිහරණය කර තිබුණි. | නැවත වාහන ලබාගැනීම සඳහා ප්‍රතිපාදන වෙන්කරන තෙක් මෙම රථ භාවිතයට ගැනීමට සිදුව ඇත. | වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන පරිහරණය කිරීමේදී ඒවා විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

(ඇ) <u>ධාවනයට යොදා නොගන්නා වාහන</u>

| | | |
|---|---|---|
| විගණනයට ලබාදුන් තොරතුරු හා කරන ලද ස්ථානීය පරීක්ෂාව අනුව ධාවනයට යොදා නොගෙන වාහන පහක් අමාත්‍යාංශය භූමියේ ආවරණයක් රහිතව ගාල්කර තිබූ අතර එකී වාහන අලුත් වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | වාහන දෙකක සම්පූර්ණ එන්ජින් අළුත්වැඩියා කිරීමට අදාළව ඉන්ජිනේරු වාර්තා කැඳවීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදුකර ඇත. අනෙක් වාහන දෙක අළුත්වැඩියා කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙතින් ප්‍රතිපාදන ඉල්ලීම් කර ඇත. | ධාවනයට යොදා නොගන්නා වාහන අලුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු කළ යුතු වීම. |

**(ඈ)** <u>වෙනත් ආයතන වලට මුදාහල වාහන</u>

| | | |
|---|---|---|
| ජල සම්පාදන අමාත්‍යාංශය විසින් 2019 මැයි 08 දින සිට WP KB-2442 දරන වාහනය ජල සම්පාදන හා සනිපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියටද, අංක WP GX-4230 හා අංක WP GX-4232 දරන වාහන 02 ක, 2020 අගෝස්තු 25 දින සිට ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව වෙතද මුදාහැර තිබුණි. | වාහන අවශ්‍යතාවය මත එම ආයතන දෙක සඳහා ලේකම්තුමාගේ අනුමැතිය ඇතිව එම රථ ලබාදී ඇත. | වෙනත් ආයතන වලට මුදාහල වාහන නැවත ලබා ගැනීමට හෝ ඒවා විධිමත් පරිදි මුදා හැරීමට කටයුතු කල යුතු වීම. |

**(ඉ)** <u>වාහන අලුත්වැඩියාව</u>

| | | |
|---|---|---|
| අංක KS-8966 දරන වාහනය අලුත්වැඩියා කටයුත්තක් සඳහා 2020 ජනවාරි මාසයේදී බාහිර ආයතනයක් වෙත භාර දී තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අලුත්වැඩියා කටයුතු අවසන් කර වාහනය ආයතනය වෙත රැගෙන ඒමට කටයුතු කර නොතිබුණි. | කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් හා ප්‍රතිපාදන නොමැතිවීම මත අළුත්වැඩියාව ප්‍රමාද වූ අතර මේ වන විට අළුත්වැඩියාවට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | කඩිනමින් අලුත්වැඩියා කර අමාත්‍යාශය වෙත රැගෙන ඒමට කටයුතු කළ යුතු වීම. |

## 3.7 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 128(1) හා 1999 අප්‍රේල් 09 දිනැති අංක 1/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 05 හා 06 ජේද ප්‍රකාරව ඇප තැබීමට බැඳී සිටින නිලධාරින් එවකට වලංගු නීතිය හා නියමයන් අනුව ඇප තැබිය යුතු වුවද එසේ ඇප තබා නොතිබුණි. | ඇප තැබිය යුතු නිලධාරීන් දැනුවත් කර ඇප තැන්පත් කිරීමට අදාළ කටයුතු කරගෙන යනු ලැබේ. | ඇප අය කර ගත යුතු නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර ඇප ලේඛනය නඩත්තු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

## 3.8 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හිටපු රාජ්‍ය ලේකම්වරයා මෙම අමාත්‍යාංශයට පත්වීම් ලබා පැමිණීමේදී රැගෙන විත් තිබූ කුලී පදනම මත ලබා ගත් වාහනය සඳහා එකී වාහනය සැපයූ ආයතනය සමඟ අමාත්‍යාංශ ලේකම් විසින් නව කුලී ගිවිසුමකට ඇතුලත් වී තිබුණි.කෙසේ වෙතත් අදාල නිළධාරියා නැවත ස්ථාන මාරු වී යාමෙන් පසු එකී වාහනය 2020 ජනවාරි සිට අප්‍රේල් දක්වා නිශ්කාර්යව තිබීම හේතුවෙන් ඒ වෙනුවෙන් ගෙවන ලද රු. 837,772 ක කුලී වියදම අමාත්‍යාංශයට අතිරේක වැය බරක් වී තිබුණි. | මෙම රථය 2020 ජනවාරි සිට අප්‍රේල් මාසය දක්වා ලබා දීම සඳහා නිලධාරියකු නොමැති වීම හේතුවෙන් එය සංචිතයේ ධාවන කටයුතු වලට යොදාගත් අතර 2021 දෙසැම්බර් වලින් ගිවිසුම් කාලය අවසන් වීමට නියමිතව ඇත. | අනාර්ථික ගනුදෙනු වැලැක්වීමට කටයුතු කල යුතු වීම. |

## 3.9 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍ය කාර්යය මණ්ඩලයේ, රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදල වෙනුවෙන් සේවකයින්ගෙන් හා ආයතනයෙන් අයකර ගන්නා මුදල් නොපමාව අදාල ආයතනය වෙත යැවිය යුතු වුවත් 2019 දෙසැම්බර් සිට 2020 දෙසැම්බර් දක්වා අවස්ථා 5ක දී සේවක අර්ථසාධක දායකය වෙනුවෙන් ගෙවිය යුතු රු. 837,351ක් ප්‍රමාද වී ප්‍රේෂණය කර තිබුණි. | කොරෝනා වසංගතය හේතුවෙන් ප්‍රමාදයක් සිදු වි තිබෙන අතර 2021 වසරේදි ප්‍රමාදයකින් තොරව ප්‍රේෂණය කිරීමට කටයුතු කර ඇත. | ව්‍යවස්ථාපිත ගෙවීම් නොපමාව අදාල ආයතන වෙත ප්‍රේෂණය කළ යුතු වීම. |
| (ආ) | 2020 වර්ෂයේ වාහන වෙන්දේසියට ඉදිරිපත් කරන ලද අංක KB-6850 සහ අංක KB-2477 දරන වාහන දෙක සඳහා වැඩිම මිල ගණන් ඉදිරිපත් කළ ටෙන්ඩර්කරුවන් එම වාහන මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව නැවත ටෙන්ඩර් කැඳවා වාහන වෙන්දේසි කිරීමට පියවර ගැනීමකින් තොරව අමාත්‍යාංශ භූමියේ එකී වාහන 2021 මැයි 20 වන දින වන විටත් අනාරක්ෂිතව ගාල් කර තිබුණි. | දෙවන ටෙන්ඩර්කරුවන් වෙත එම රථ ලබාදීම සිදු නොකළේ පළමු හා දෙවන ටෙන්ඩර්කරුවන් සාකච්ඡා කර මිළ ගණන් අඩුවෙන් වාහන ලබා ගැනීමට උත්සහ දරන බවට ලද තොරතුරු හේතුවෙනි. | නැවත ටෙන්ඩර් කැඳවා කඩිනමින් වෙන්දේසි කිරීමට කටයුතු කළ යුතු වීම. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

**---------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ------------------------------- | ------------ |
| (අ) | ජල සම්පාදන අමාත්‍යාංශයේ තිරසර සංවර්ධන අරමුණු ලෙස 2030 වන විට සැමට අපේක්ෂිත පානීය ජලය ලබාදීම හා සනීපාරක්ෂක පහසුකම් තහවුරු කිරීම හඳුනාගෙන තිබූ අතර එකී අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) හයක් අනුව ප්‍රගතිය මැනබැලීම සිදු කර තිබුණි. නමුත් අපේක්ෂිත පානීය ජලය ලබාදීම යටතේ ආරක්ෂිත පානීය ජලය ලබාදීමේදී එහි ගුණාත්මකභාවය තහවුරු කර ගැනීම සඳහා ප්‍රමාණවත් ජල පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. | පානීය ජලයේ ගුණාත්මක භාවය තහවුරු කර ගැනීම සඳහා දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි ග්‍රාමීය ජල සම්පාදන ක්‍රම , නළ ළිං හා කණින ලද ළිං වල ජලයේ ගුණාත්මකභාවය පරික්ෂා කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇති අතර ඒ යටතේ ජල සාම්පල් 81947 ක ප්‍රමාණයක් පරීක්ෂා කර ඇත. | ආරක්ෂිත පානීය ජලය ලබා දීම තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් ජල සාම්පල පරීක්ෂාවන් සිදු කළ යුතු වීම. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට අංක එම්එස්ඩීඩබ්/8/65 දරන 2018 අප්‍රේල් 27 දිනැති තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට සම්බන්ධීකරණ කටයුතු සඳහා නිලධාරීන් දෙදෙනෙකු නම් කර නොතිබුණි. | මේ සඳහා එක් නිලධාරියෙකු පත් කර අධ්‍යක්ෂ ජනරාල් තිරසර සංවර්ධන කමිටුව වෙත ලිපියක් යොමු කර ඇත. | අදාල චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) අනුමත කාර්ය මණ්ඩලය, සත්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම** | | |
| (i) ආයතනයේ සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාව 30 ක් වූ අතර ඒතුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 09 ක්, තෘතියික මට්ටමේ තනතුරු 03ක්, ද්විතියික මට්ටමේ තනතුරු 12ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 06ක පුරප්පාඩු පවතුණි. | පිළිතුරු ලබා දී නැත. | අත්‍යාවශ්‍ය තනතුරු සඳහා වන පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) රාජ්‍ය වියදම් කළමණාකරණය යන හිසින් යුත් 2010 මැයි 14 දිනැති සීඒ/1/17/1 දරන ජනාධිපති කාර්යාල ලිපියේ 2.2 ඡේදයේ දක්වා ඇති තනතුරු සඳහා සේවකයින් අනියම් හෝ කොන්ත්‍රාත් පදනමින් බඳවා ගනු ලබන්නේ නම්, ඔවුහු රජයේ අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ සුදුසුකම් සපුරා තිබිය යුතු විය. එහෙත් අමාත්‍ය කාර්යය මණ්ඩලය වෙනුවෙන් බඳවාගෙන තිබූ තනතුරු 04කට අදාල සේවකයින් 10ක් නියමිත සුදුසුකම් සපුරා ඇති බවට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. | ඇමතිතුමාගේ අභිමතය පරිදි පත්කිරීම් සිදුවන බැවින් අදාල සුදුසුකම් පරීක්ෂා කිරීම ප්‍රායෝගික නොවේ. | ජනාධිපති කාර්යාල උපදෙස් ප්‍රකාරව සේවකයින් අනියම් හෝ කොන්ත්‍රාත් පදනමින් බඳවා ගනු ලබන්නේ නම් ඔවුන් රජයේ අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ සුදුසුකම් සපුරා ඇති බවට තහවුරු කර ගත යුතු වීම. |
| **(ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබා ගත් මානව සම්පත්** | | |
| (i) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ලද තොරතුරු අනුව තනතුරු 05 කට අයත් මණ්ඩලයේ සේවකයින් 17 දෙනෙකු සමාලෝචිත වර්ෂය තුළදී අමාත්‍යාංශයට නිදහස් කර තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙතින් තනතුරු 08කට අදාල නිලධාරීන් හා සේවකයින් | ගරු ජල සම්පාදන අමාත්‍යාතුමාගේ පෞද්ගලික ලේකම්ගේ ඉල්ලීම මත අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලය වෙත නිදහස් කර ඇත. | වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත් අදාල ආයතන වෙත නැවත නිදහස් කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| 15 ක් අමාත්‍යාංශයේ සේවය සඳහා යොදවා ඇති අතර එකී සේවකයින් හා නිලධාරීන් වෙනුවෙන් 2020 දෙසැම්බර් 31 දින දක්වා රු.37,988,182ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. | | |
| (ii) 2012 වර්ෂයේ සිට ජල සම්පාදන මණ්ඩලයේ නිලධාරීන්ගේ සේවය අමාත්‍යාංශය වෙත ලබාගෙන තිබුණු අතර 2020 වර්ෂයේ අමාත්‍යාංශයේ සේවය කළ නිලධාරීන්ගෙන් දෙදෙනෙකු එම නිලධාරීන්ගේ නිත්‍ය තනතුරට පරිබාහිර අමාත්‍යාංශයේ තනතුරු දෙකක සේවයේ යෙදෙන බවත් නිරීක්ෂණය විය. | මෙම නිලධාරීන් දෙදෙනා විධිමත් පරිදි ප්‍රසම්පාදන අංශය හා මාධ්‍ය අංශය වෙත අනුයුක්ත කර ඇත. | -එම- |
| (iii) ජල සම්පාදන මණ්ඩලයේ රියදුරන් 07 දෙනෙකු අමාත්‍යාංශයේ සේවය කරන අතර ඒ අනුව සමස්ථ රියදුරු සංඛ්‍යාව 16 ක් වීමෙන් අනුමත රියදුරු සංඛ්‍යාව ඉක්මවා රියදුරන් දෙදෙනෙකු සේවය කරන බව නිරීක්ෂණය විය. | ගරු ජල සම්පාදන අමාත්‍යාතුමාගේ පෞද්ගලික ලේකම්ගේ ඉල්ලීම මත අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලය වෙත නිදහස් කර ඇත. | අනුමත සේවක සංඛ්‍යාව නොඉක්මවිය යුතු වීම හා වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත් අදාල ආයතන වෙත නැවත නිදහස් කළ යුතු වීම. |